04 නිමහම් කිරීමේ අවශ්‍යතාව.

නිමවුමක හෝ ඉදිකිරීමක අවසන් ක්‍රියාවලිය වන්නේ, එම නිමවුම හෝ ඉදිකිරීම නිමහම් කිරීමයි. නිමහම් කිරීමේ දී එම නිර්මාණය කිරීමට යොදා ගත් ද්‍රව්‍ය අනුව යෙදිය යුතු නිමහම් ක්‍රමය තීරණය කළ යුතු වේ.

නිමහම් කිරීම නිසා එම නිර්මාණයට අත්වන වාසි මොනවාදැයි සොයා බලමු.

4.1 රූපය - නිමහම් නො කළ නිවසක්

4.2 රූපය - කපරාරු කොට නිමහම් කළ නිවසක්

බිත්ති බැඳ අවසන් කර ඇති 4.1 රූප සටහනේ ඇති ගොඩනැගිල්ල හා කපරාරු කොට නිමහම් කර ඇති 4.2 රූප සටහනේ ඇති ගොඩනැගිල්ල සංසන්දනය කර බලන්න.

සෞන්දර්යාත්මක බව ඇති කරයි.

වර්තමාන ලෝකයේ ජීවත් වන පුද්ගලයන්ගේ අවශ්‍යතා විවිධ වේ. විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ තරගයක් පවතී. ඉදිරිපත් කරනු ලබන භාණ්ඩයට හොඳ මිලක් ලබා ගැනීමේ අරමුණ ඇති ව නෙත් සිත් වසඟ වන ආකාරයේ නිර්මාණ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. නිර්මාණයේ මතු පිට පෘෂ්ඨය මත විවිධ ආලේපන සහ වර්ණ රටාවන් තුළින් සෞන්දර්යාත්මක බව ඇති කෙරේ. නිමැවුම් සඳහා කරනු ලබන වියදම්වලින් වැඩි ප්‍රමාණයක් සෞන්දර්යාත්මක වටිනාකම වෙනුවෙන් වැය කෙරේ. සෞන්දර්යාත්මක බව සැලකීමේ දී නෙතට ප්‍රිය උපදවන බව හෙවත් අලංකාරය එක් වන්නේ නිමහම් කිරීම තුළිනි. නිමහම් ක්‍රම මගින් උසස් තත්ත්වයේ කලාත්මක නිර්මාණ බිහි වේ. එහි ආර්ථික වටිනාකම ද ඉහළ යයි.

සංරක්ෂණය

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිර්මාණයක් දිගු කාලයක් පැවතීම හෝ භාවිතයට ගැනීමට හැකි වීම අත්‍යවශ්‍ය වේ. ඒවා දුර්වර්ණ වීම, දිරා යෑම, ගෙවී යෑම, සීරීම, පලුදු වීම වැනි හානි තත්ත්වන්ට බඳුන් වීම අවම කිරීම සංරක්ෂණය ලෙස හැඳින්වේ. නිර්මාණයකට ඉහතින් දක්වන ලක්ෂණ ඇති වීමට හේතු විය හැකි වන්නේ,

- තෙතමනය නිසා සිදු වන ප්‍රසාරණය හා සංකෝචනය දිරා යෑමට හේතු වේ.
- තෙතමනය ඉක්මනින් ඉවත් වීම, පැලීම් ඇති වීමට හේතු වේ.
- කෘමි සතුන් මගින් හානි සිදු වීම.
- සතුන් ලැගීම හා කුඩු තැනීම නිසා සිදු වන හානි.
- සූර්යාලෝකයට නිරාවරණය වීමෙන් දුර්වර්ණ වීම.
- ගැටීම නිසා සිදු වන සීරීම හා ගෙවී යාම.
- රසායනික ද්‍රව්‍ය මගින් මතු පිට පෘෂ්ඨයේ සිදු වන පිලිස්සීම්.
- ගිනි ගැනීම් නිසා පෘෂ්ඨයේ සිදු වන පිලිස්සීම්.

සංරක්ෂණ කාර්යයේ දී දැවවලින් නිර්මිත භාණ්ඩ සඳහා දැව ආරක්ෂණ ආලේපන (Wood Preservative) යොදා ගනු ලබයි. මේවා කළු හෝ අවර්ණ ආලේපන ලෙස ද ලබා ගත හැකි ය. එමෙන් ම දැවමය පෘෂ්ඨ ඇතුළට ම කාවදින ලෙස සකසා ඇත. ගඩොල් හෝ බ්ලොක් ගල් බැමි සඳහා ජල මුද්‍රිත ආලේප (Water Rsistant Sealer) යොදා ගනී. මෙමගින් බිත්ති මතින් සිදු වන ජල කාන්දු සහ බිත්ති ඇතුළතින් සිදු වන ජල කාන්දුවලට පිළියමක් වේ. ලෝහ පෘෂ්ඨ සඳහා මල නිවාරණ (Anti - Corrosive) තීන්ත අලේප කරයි.

පිරිසිදු කිරීම

සෞඛ්‍ය ආරක්ෂිත ජීවිතයක් සඳහා පිරිසිදුකම අත්‍යවශ්‍ය කාරණයකි. පරිහරණය සහ කල් ගත වීම නිසා අපිරිසිදු වීම සිදු වේ. ඒවාට හේතු වන්නේ දූවිලි සහ කුණු තැවරීමයි. එමෙන් ම හිතකර පරිසර සාධක ඇත්නම් දිලීර සහ පුස් වර්ග ද වර්ධනය වීමට හේතු වේ. ඒවා මතුපිට පෘෂ්ඨය අවලස්සන කරයි. නිමහම් කිරීම මගින් පිරිසිදු කිරීමේ පහසුව ඇති කරයි. නිමහම් නො කර ඇති ගඩොල් බැම්මක් ගැන හිතන්න එවැනි බිත්තියක රළු බව නිසා දූවිලි රැඳීම වැඩි ය. පිරිසිදු කිරීමට යෑමේ දී පිරිසිදු කරන උපකරණය හා ගැටීම නිසා තව තවත් දූවිලි මතු වීම සිදු වේ. ජලය උරා ගැනීම වැඩි ය. එම නිසා දිලීර හා පාසි වැනි ශාඛ වර්ධනයට හේතු වේ. ඒ නිසා කුණු සහ දූවිලි බැඳීම, දිලීර වර්ධනය, ජලය උරා ගැනීම අවම කර ගත හැකි වන්නේ නිමහම් කිරීම තුළිනි.

විවිධ නිමවුම් සඳහා නිමහම් කිරීමේ ක්‍රම

වර්තමානයේ ඉදිකරන හෝ නිර්මාණය කරනු ලබන නිමවුම් සඳහා දැව, ගඩොල්, බ්ලොක් ගල්, කොන්ක්‍රීට්, ලෝහ ආදී ද්‍රව්‍ය යොදා ගනී. එක ම ඉදිකිරීමක දී වුව ද මෙම ද්‍රව්‍යයන්ගෙන් කිහිපයක් හෝ සියල්ලට ම හෝ යොදා ගනී. නිමවුමකට යොදා ගන්නා එවැනි ද්‍රව්‍යයන්ගේ විවිධත්වය අනුව ඒවා සඳහා යොදා ගන්නා නිමහම් ක්‍රමවල ද විවිධත්වයක් ඇත. මෙම පාඩම තුළින් එක් එක් ද්‍රව්‍ය සඳහා සුදුසු නිමහම් ක්‍රම මොනවාදැයි සොයා බලමු.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දැව පෘෂ්ඨ සඳහා නිමහම්

මුලින් ම දැව පෘෂ්ඨ සඳහා යෙදිය හැකි නිමහම් ක්‍රම මොනවාදැයි සොයා බලමු. දැව පෘෂ්ඨ යනුවෙන් අදහස් කරනුයේ, ගෘහ භාණ්ඩ, දොර ජනෙල් රාමු සහ පියන්, පැන්ට්‍රි කබඩ් සහ වහල රාමු කොටස් යනාදිය වේ. ඒ සඳහා පහත ක්‍රම භාවිත කළ හැකි ය.

- තීන්ත ආලේප කිරීම හෙවත් පින්තාරුව.
- ඔප දැමීම
- ලාක්ෂා කිරීම
- ආස්තරණ යෙදීම

නිමහම් කිරීමේ දී මූලිකව ම එම නිර්මාණයන්හි මතු පිට සුමට කිරීම කළ යුතු ය. දැව පෘෂ්ඨ නියමිත පරිදි සුමට කිරීම මගින් නිමහම් ක්‍රියාවලිය ද සාර්ථක වීමට හේතු වේ. එම නිසා සුමට කිරීමේ ක්‍රියාවලිය සඳහා වැඩි සැලකිල්ලක් ලබා දිය යුතු වේ.

සුමට කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය, ආවුද හා උපකරණ

- කැට යත්ත (Smoothing plane) නිම කළ නිමවුමක මතුපිට පෘෂ්ඨ, දාර, සන්ධි කළ කොටස් සුමට ලෙස මට්ටම් කර ගැනීමට භාවිත කරයි.
- රාස්පය (Rasp) වෘත්තාකාර හැඩ නියමිත පරිදි සුමට කිරීමට භාවිත කරයි.
- සූරන තහඩුව (Scraper) යතු ගා මට්ටම් කර ඇති ලී පෘෂ්ඨ තව දුරටත් සුමට කර ගැනීමට භාවිත කෙරේ. වර්තමානයේ මේ වෙනුවට වීදුරු තහඩු ද භාවිත කරයි.

4.3 රූපය - සූරන තහඩුව භාවිතයෙන් සුමට කිරීම

- වැලි කඩදාසි (Sand paper) දැව පෘෂ්ඨ අවසාන වශයෙන් සුමට කිරීමට භාවිත කරයි. මේවා නිමැදුම් කඩදාසි ලෙස ද හැඳින්වේ. වැලි කඩදාසිවල රළු හෝ සිනිඳු ස්වභාවය එහි ග්‍රිට් අංකය මගින් හැඳින්වේ. ග්‍රිට් අංකය 100 ට අඩු එනම්, ග්‍රිට් 40,60,80,100 රළු වැලි කඩදාසි ලෙස හැඳින්වේ. ග්‍රිට් අංකය 120 සිට ඉහළට සිනිඳු වැලි කඩදාසි ලෙස හැඳින්වේ.



4.4 රූපය - විවිධ ග්‍රිට් ප්‍රමාණයේ වැලි කඩදසි

- සුමට කිරීම අතින් සහ යන්ත්‍ර මගින් කළ හැකි ය. යන්ත්‍ර මගින් සුමට කිරීම සඳහා සුදුසු වැලි කඩදසි නිපදවා ඇත. ඒවා භාවිත කිරීමට යොදා ගන්නා යන්ත්‍ර නිමැදුම් යන්ත්‍ර ලෙස හැඳින්වේ.

4.5 රූපය - නිමැදුම් යන්ත්‍රයක්



4.6 රූපය - නිමැදුම් යන්ත්‍ර සඳහා සැකසූ වැලි කඩදසි

- පිරවුම් කාරක (Pillar) ද්‍රවයේ කුහර, පළුදු, ගිලා බැසීම් ඇත්නම් පෘෂ්ඨය සම මට්ටමට ගෙන ඒමට පිරවුම් කාරක යොදා ගනී.

සුමට කිරීමේ ක්‍රියාවලියේ දී සැලකිය යුතු කරුණු.

- සූරන තහඩුව, කැට යත්ත හෝ වැලි කඩදසි භාවිතයේ දී සෑම විට ම දැව කොටස්වල මාංශයට සමාන්තර ව ගෙන යා යුතු ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- වැලි කඩදසි භාවිතයේ දී සෑම විට ම වැලි කඩදසි කොට්ටයක් භාවිත කළ යුතු ය.
  සුමට කරනු ලබන පෘෂ්ඨයේ ඇති දර, බොරදම්, සහ හැඩයන් ආරක්ෂා වන පරිදි නිමැඳුම් කළ යුතු ය.
- සුමට කරනු ලබන පෘෂ්ඨයක් මත නැවත එයට හානි සිදු වන සේ වෙනත් දෑ සමග නො ගැටෙන ලෙස තැබිය යුතු ය.
- සුමට කරනු ලබන පෘෂ්ඨයක් මත තෙල් හෝ ග්‍රීස් නො ගෑවෙන ලෙස ආරක්ෂා කළ යුතු ය.

4.7 රූපය - මාංශයට සමාන්තර වැලි කඩදසි කොට්ටය භාවිතයෙන් මැදීමක්

පිරවුම් කාරක ලෙස භාවිත කළ හැකි ද්‍රව්‍ය හා මිශ්‍රණ

- පොටි
- වැලි කඩදසිවලින් මැදීමේ දී එම දැවයෙන් ඉවත් වන ලී කුඩු අවර්ණක සීලර් සමග මිශ්‍ර කර සාද ගන්නා මිශ්‍රණ
- වැලි කඩදසිවලින් මැදීමේ දී එම දැවයෙන් ඉවත් වන ලී කුඩු බයින්ඩර් මැලියම් සමග මිශ්‍ර කර සාද ගන්නා මිශ්‍රණ
- ප්ලාස්ටර් ඔෆ් පැරිස් සීලර් සමග මිශ්‍ර කර සාද ගන්නා මිශ්‍රණය
- කැට්ලොයි පේස්ට්
- රත් කොට ද්‍රව බවට පත් කරගත් මී ඉටිවලට ටර්පන්ටයින් යොද සකසා ගන්නා මිශ්‍රණ

තීන්ත ආලේප කිරීම.

දැවයේ ස්වාභාවික පෙනුම වැසී යන අයුරින් එනමල් වර්ගයේ තීන්ත ආලේප කිරීම මෙයින් අදහස් වේ. දැවයේ ස්වාභාවික ගති ලක්ෂණ වැසී යෑම නිසා වටිනා දැව වර්ග සඳහා හෝ අලංකාර දැව විශේෂ කෙරෙහි තීන්ත ආලේප කිරීම සුදුසු නොවේ. එම නිසා වටිනාකමින් අඩු දැව විශේෂවලින් කරන ලද නිමවුම් හෝ උද්‍යාන බංකු වැනි එළිමහනේ තබා ඇති නිමවුම් සේම ළමා සහ ළදරු භාවිතය සඳහා නිර්මිත විවිධ වර්ණ භාවිත කළ යුතු නිර්මාණ සඳහා සුදුසු වේ. ඒ නිසා තීන්ත ආලේපයක් තෝරා ගැනීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු ය.

- අව් රශ්මියට, වර්ෂාවට, තෙතමනයට, ලවණ සහිත මුහුදු සුළඟට ඔරොත්තු දිය යුතු ය.
- කල් යෑමේ දී දුර්වර්ණ නො විය යුතු ය.
- විෂ රහිත විය යුතු ය.
- වඩාත් හොඳ වියළීමක් ලබා දිය යුතු ය.
- කල් යෑමේ දී ඉරි තැලීම් පතුරු ගැලවීම් සිදු නො විය යුතු ය.
- කෘමි හානිවලින් ආරක්ෂා විය යුතු ය.
- දිලීර හට ගැනීමෙන් සහ පුස් බැඳීමෙන් වැළකිය යුතු ය.
- ආලේප කිරීම පහසු විය යුතු ය.
- අඩංගු ඊයම් ප්‍රතිශතය අඩු විය යුතු ය.

4.8 රූපය - එනමල් තීන්ත ඇසුරුමක්

යටි ආලේප යෙදීම (Base coat)

4.9 රූපය

නිමහම් ලේපයක් ලෙස තීන්ත ආලේප කිරීමේ දී මුලින් ම යටි ආලේපයක් යෙදිය යුතු ය. ඒ සඳහා ඇලුමිනියම් සීලර් (Aluminum sealer) ආලේප කළ යුතු ය. වෙළෙඳපොළේ දී මේවා ඇලුමිනියම් වුඩ් ප්‍රයිමර් (Aluminum wood primer) වුඩ් ප්‍රයිමර් (wood primer) ලෙසින් මිල දී ගත හැකි ය. යටි ආලේපයක් යෙදීමෙන් දැවවල කුඩා සිදුරු වසා පෘෂ්ඨය සුමට තත්ත්වයට පත් කරයි. තෙතමනය උරා ගැනීම පාලනය කරයි. දැවයට උරා ගන්නා තීන්ත ප්‍රමාණය ද අඩු කරයි.

4.10 රූපය

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආලේප කිරීමේ දී අනුගමනය කළ යුතු උපදෙස්.

- නිෂ්පාදකයා විසින් සපයා ඇති උපදෙස් හොඳින් කියවා තේරුම් ගත යුතු ය.
- ඇසුරුම තුළ ඇති නිමහම් ලේපය ආධාරකයක් මගින් හොඳින් කලවම් කළ යුතු ය.
- නිර්මාණයට ප්‍රමාණවත් අලේප ප්‍රමාණයක් වෙනත් බඳුනකට ගත යුතු ය.
- ගැළපෙන ද්‍රාවකය උපදෙස් පරිදි නියමිත අනුපාතයට මිශ්‍ර කර ගත යුතු ය.
- ආලේපයේ දී දැවයේ මාංශයට සමාන්තර ව ආලේප කළ යුතු ය.
- පළමු ආලේපය වියළුණු පසු දෙ වන වර ආලේප කළ යුතු ය.
- පළමු ආලේපය වියළුණු පසු දෙ වන ආලේපයට පෙර ග්‍රිට් 320 හෝ 400 වැලි කඩදසියකින් මැද පිරිසිදු කර ගත යුතු ය.
- ආලේපයෙන් පසු භාවිත උපකරණ පිරිසිදු කර තැබිය යුතු ය.

4.11 රූපය - සීලර් ආලේපයෙන් පසු වැලි කඩදසි මැදීමක්

ආලේපය සඳහා සුදුසු ප්‍රමාණයේ බුරුසු භාවිත කළ හැකි ය. බුරුසුවක් මගින් තීන්ත ආලේපයේ දී එහි කෙඳිවලින් 1/3 කට වැඩි ප්‍රමාණයක් තීන්තවල නො ගිල්විය යුතු ය. වැඩිපුර තීන්ත බුරුසුවේ තැවරුනහොත් බඳුනේ වියළි පෙදෙසට බුරුසුව තද කොට වැඩිපුර ඇති තීන්ත ඉවත් කර ගත යුතු ය.

තීන්ත ආලේපය

4.12 රූපය - එනමල් තීන්ත ආලේප කර ඇති දොරක්

තීන්ත ආලේප කර නිමහම් කිරීමේ දී අවසාන ක්‍රියාවලිය වන්නේ එනැමල් තීන්ත (Enamel paint) ආලේපයි. යටි ආලේපය හොඳින් වියළුණු පසු ඉතා සිනිඳු වැලි කඩදාසියකින් (ග්‍රිට් 320 - 400) සුමුදු ව මැද, මතුපිට පිරිසිදු කර ගැනීමෙන් පසු උපදෙස් පරිදි සකස් කර එනැමල් තීන්ත ආලේප කළ හැකි ය. පළමු ආලේපය වියළීමට සුදුසු කාලයක් දී ඉන් පසු ව නැවත ඉතා සිනිඳු වැලි කඩදාසියකින් (ග්‍රිට් 320 හෝ 400) සුමුදු ව මැද මතුපිට පිරිසිදු කර ගැනීමෙන් පසු දෙ වන ආලේපය කිරීමෙන් අලංකාර මතුපිටක් ලබාදේ.

තීන්ත ආලේප කිරීමෙන් පසු සුදුසු ද්‍රාවකයක් යොද බුරුසුව හොඳින් පිරිසුදු කර ගන්න.

වර්ණ ගැන්වීම හා ඔප ගැන්වීම

4.13 රූපය - වර්ණ ගැන්වීමක්

දුව පෘෂ්ඨයන්හි පවතින ස්වාභාවික ලක්ෂණ මතු කර දක්වෙන පරිදි වර්ණ ආලේප යොදමින් නිමහම් කිරීම මෙමගින් බලාපොරොත්තු වේ. මෙහි දී බාල දුව මත උසස් දුවයක පෙනුම ඇති කිරීමට අරමුණු කර ගන්නා අතර ම එක ම දුවයේ පවතින වර්ණ පරාසයේ වෙනස අඩු කොට දුව පෘෂ්ඨය එක ම වර්ණයකට පත් කිරීමට ද බලාපොරොත්තු වේ.

ඔප දැමීම සඳහා භාවිත ආලේපන වර්ග කිහිපයකි.

- වාර්නිෂ් (Varnish) ආලේපය
- ප්‍රංශ පොලිෂ් ආලේපය (French polish)
- ලැකර් (Lacquer) ආලේපය
- ඉටි (Wax) ආලේපය

ලී වර්ණ ගැන්වීම සඳහා භාවිත කරන වර්ණ කාරක ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

- ජලයේ දිය වන වර්ණක
- ස්ප්‍රීත්තුවල දිය වන වර්ණක

ජලයේ දිය වන වර්ණක භාවිතය

4.14 රූපය - ජලයේ දිය වන වර්ණ

විවිධ දුව විශේෂවල පවතින ආවේනික වර්ණයට සමාන වර්ණ ලබා ගත හැකි කුඩු විශේෂයකි. මේවා ග්‍රෑම් 25 පමණ ප්‍රමාණයන්ගෙන් කුඩා ප්ලාස්ටික් ඇසුරුම්වල අසුරා ඇත. වෙළෙඳපොළෙන් මිල දී ගත හැකි ය. ආලේප කිරීමට සුදුසු අයුරින් සකසා ගැනීමට නම් නටවා ගත් ජලය තුළ ටික වේලාවක් තැම්බෙන්නට හැරිය යුතු ය. කුඩු මිශ්‍ර කිරීමේ දී ජලය ලීටර එකක් සඳහා ග්‍රෑම් 25 ක් ප්‍රමාණවත් වේ. ජලයේ දිය වන වර්ණක භාවිත කරන විට මතුපිට පෘෂ්ඨය සකස් කිරීමට ජලයේ දිය නොවන පිරවුම් කාරක භාවිත කළ යුතු ය. සකස් කරගත් වර්ණක බුරුසුවක් ආධාරයෙන් ආලේප කළ හැකි ය. එසේ ආලේප කර ගත් පසු වියළීමට පෙර රෙදි කඩකින් පිස දැමීමෙන් පෘෂ්ඨය සෑම තැන ම වර්ණකය සමසේ පැතිරේ. යොදන ලද ආලේපනය දිනක් පමණ වියළීමට තැබිය යුතු ය. ඉන් අනතුරු ව ඒ මත පාරදෘශ්‍ය සීලර් ආලේප කළ යුතු ය.

ස්ප්‍රීත්තුවල දිය වන වර්ණක

මෙම වර්ණක කුඩු සහ දියර වශයෙන් ලබා ගත හැකි ය. කුඩු වශයෙන් ඇති වර්ණක තිනර් හෝ වයින් ස්ප්‍රීතු සමග දියකර ගත යුතු ය. ආලේපයේ දී නිසි අයුරින් සුමට කර ගන්නා ලද පෘෂ්ඨය මත පාරදෘශ්‍ය සීලර් එක් වරක් ආලේප කර වියළුණු පසු ග්‍රිට් 320 වැලි කඩදාසියකින් සුමට කිරීමෙන් පසු පෘෂ්ඨය මත ස්ප්‍රීතු වර්ණක හා පාරදෘශ්‍ය සීලර් 1:25 අනුපාතයට මිශ්‍ර කර ආලේප කළ යුතු ය. ආලේප කිරීම සඳහා විසිරණයක් භාවිත කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලබා ගත හැකි ය. එය වියළීමෙන් පසුව ඒ මත නැවත පාරදෘශ්‍ය සීලර් ආලේපනයක් යොදා සුමට වැලි කඩදාසියෙන් නිමැදුම් කළ යුතු ය.

විවිධ දැව විශේෂයන්ගේ වර්ණ සහිත ස්ප්‍රීතු වර්ණක පාරදෘශ්‍ය සීලර් සමග මිශ්‍ර කොට තනන ලද නිෂ්පාදන වර්තමාන වෙළෙඳපොළෙහි අලෙවිය සඳහා ඇත.

4.15 රූපය
ස්ප්‍රිත්තුවල දිය වන වර්ණක

මෙසේ පෘෂ්ඨය වර්ණ ගැන්වීමෙන් පසු නැවත වරක් පාරදෘශ්‍ය සීලර් ආලේපයක් කර සුමට වැලි කඩදාසියක් භාවිත කර නිමදුම් කිරීමෙන් පසුව අභිමත පරිදි වාර්නිෂ් මගින් ඔප දැමීම, ප්‍රංශ පොලිෂ් භාවිතය, ලැකර් ආලේපනය, හෝ ඉටි යන ආලේපවලින් එකක් යෙදිය හැකි ය.

වාර්නිෂ් මගින් ඔප දැමීම

ඉහත ආකාරයට සකස් කර ගත් පෘෂ්ඨ මත පාරදෘශ්‍ය වාර්නිෂ් හෝ වර්ණ වාර්නිෂ් (වාර්නිෂ් ද විවිධ දැව විශේෂයන්ට ගැළපෙන පරිදි වර්ණ යොදා සකස් කර ඇත. ඒවා වර්ණ වාර්නිෂ් ලෙස හැඳින්වේ.) ආලේප කළ හැකි ය. ආලේපයේ දී බුරුසු භාවිතයෙන් ආලේප කළ හැකි වුව ද විසිරණ යන්ත්‍ර භාවිතයෙන් අලංකාර පෙනුමක් ලබා ගත හැකි ය.

4.16 රූපය - වාර්නිෂ් ආලේප කිරීමක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ප්‍රංශ පොලිෂ් මගින් ඔප දැමීම

ගෘහ භාණ්ඩ වැඩි වශයෙන් පොලිෂ් ආලේපය මගින් ඔප දැමීම කරනු ලැබේ. විවිධ වෙළෙඳ නාම යටතේ නිපද වූ පොලිෂ් වර්ග දක්නට ලැබේ. බුරුසු මගින් පොලිෂ් ආලේප කළ හැකි ය. ඊට අමතර ව කපු පුළුන් හා රෙදි කඩක් ආධාරයෙන් සකස් කර ගත් පොට්ටනියකින් වයින් ස්ප්‍රීතු යොදා තුනී කරගත් පොලිෂ් ඇතිල්ලීමෙන් වඩාත් ඔපවත් පෘෂ්ඨයක් ලබා ගත හැකි ය. ඔප දමන ලද පෘෂ්ඨය මත පොට්ටනිය වැඩිපුර තැවරුනහොත් ඔප ගතිය විනාශ වේ.

ලැකර් ආලේපනය



4.17 රූපය - විසිරන යන්ත්‍ර මගින් ලැකර් ආලේප කිරීමක්

සුමට කිරීම හා වර්ණ ගන්වා සීලර් යෙදීමෙන් පසු උසස් හා කල් පවත්නා නිමාවක් ලබා ගැනීම පිණිස ගෘහ භාණ්ඩ නිෂ්පාදකයෝ ලැකර් භාවිත කරති. මේවා දිලිසෙන හා නො දිලිසෙන ලෙස වර්ග දෙකක් පවතී. විසිරනයක් ආධාරයෙන් ආලේපනය කිරීමෙන් උසස් නිමාවක් ලබා ගත හැකි ය.

ඉටි ආධාරයෙන් ඔප දැමීම

4.18 රූපය - ඉටි ආලේප කිරීම

ඉටි ආධාරයෙන් ඔප දැමීමේ දී, රෙදි කඩකින් පෘෂ්ඨය මත තුනියට ආලේප කර පැයක් පමණ වේලාවක් වියළෙන්නට හැර තැබිය යුතු ය. ඉන් පසුව ඝන රෙදි කඩකින් හෝ කොහු කෙඳි යොදා සකසනු ලැබූ බුරුසුවකින් තදින් මැදීමෙන් මතුපිට පෘෂ්ඨය ඔප දැමීම කළ හැකි ය. කෙඳි සහිත තැටි යොදා ගනිමින් කුඩා විදුලි යන්ත්‍ර භාවිතයෙන් ද ඔප දැමීම කරනු ලැබේ.

ලාක්ෂා යෙදීම

4.19 රූපය - ලාක්ෂා කරන ලද නිමැවුමක මෝස්තර මතු කිරීමක්

4.20 රූපය - ලාක්ෂා නිමැවුම් සහ යොදා ගන්නා ද්‍රව්‍ය හා උපකරණ

සතුන්ගෙන් ලබා ගන්නා මැලියම් විශේෂයක් භාවිත කරමින් සකස් කර ගන්නා ලාක්ෂා යොදා ගෙන දැවයෙන් නිර්මාණය කර ඇති නිමැවුම් නිමහම් කරනු ලැබේ. ලාක්ෂාවල මූලික වර්ණය රතු පාට වන අතර විවිධ ද්‍රව්‍ය යොදා ගැනීමෙන් වර්ණ කිහිපයක් සකස් කර ගනී. බොහෝ විට සේසත්, මුතු කුඩ මිටවල් සඳහා ආලේප කරන අතර, ආභරණ බහාලුම් සඳහා ද ආලේපනය කරයි. ලාක්ෂා රත් කිරීමෙන් හා කෘත්‍ය රත් කිරීමෙන් ආලේපන යොදයි.

ආස්තරණ යෙදීම

දැවයෙන් නිපදවනු ලැබූ ඇතැම් නිර්මාණ මත ආස්තරණ ඇලවීමෙන් වඩාත් ආකර්ෂණීය පෙනුමක් ලබා ගත හැකි ය. වටිනාකමෙන් මදක් අඩු දැව සඳහා මෙන් ම කෘත්‍රිම දැව වර්ග වන එම්.ඩී.එෆ් බෝඩ් චිප් බෝඩ්, හාර්ඩ් බෝඩ්වලින් නිර්මාණය කරන ලද නිමවුම් සඳහා ආස්තරණ ඇලවීමෙන් වැඩි වටිනාකමක් දිය හැකි ය. ආස්තරණ ඇලවීම සඳහා උචිත ඇලවුම් ද්‍රව්‍ය යොදා ගැනේ. වර්තමානයේ ඇලවුම් වර්ගයේ ආස්තරණ බහුල ව භාවිත කරයි. ඒවා යොදාගෙන රූපවාහිනී රැඳවුම්, ස්පීකර් පෙට්ටි ආදිය නිපදවනු ලැබේ. මෙලමයින් බෝඩ් වැනි ආස්තරණ අලවන ලද බෝඩ් වෙළෙඳපොළෙන් මිල දී ගත හැකි ය.

4.21 රූපය - ආස්තරණ යෙදූ මේසයක්

පෙදරේරු ව්‍යූහ නිමහම් කිරීම.

ඉදිකිරීමක ඇති බිත්ති, ගෙබිම සහ වහලය යන කොටස් නිමහම් කිරීමට සුදුසු නිමහම් ක්‍රම ඇත. ඒවා සකස් කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය අනුව නිමහම් ක්‍රමය තීරණය වේ. බිත්ති නිර්මාණයට ගඩොල්, බ්ලොක් ගල්, දැව, රළු ගල්, කබොක් ගල් සහ කොන්ක්‍රීට් යන ද්‍රව්‍ය යොදා ගැනේ. (දැව පෘෂ්ඨ ගැන කලින් සාකච්ඡා කොට ඇත.) ගෙබිම සඳහා ගඩොල්, කඩා ගන්නා රළු ගල් කොටස් සහ කොන්ක්‍රීට් භාවිත කරයි.

බිත්ති නිමහම් කිරීමේ ක්‍රම (Wall finishes)

- කපරාරු කිරීම රළු / සිනිඳු (Plastering)
- බිත්ති උළු ඇතිරීම (Wall tilling)
- විචිත්‍රණය (Mosaic)
- ඔප දමන දැව කොටස් ඇල්ලීම (Wood panels)
- ස්වාභාවික / කෘත්‍රිම ගල් ඇල්ලීම (Natural stone / Artificial stones - Granite)
- ප්ලාස්ටික් / පී.වී.සී. තහඩු ඇල්ලීම (PVC Panels)
- ඇලුමිනියම් ක්ලැඩින් ඇල්ලීම
- බිත්ති කඩදාසි ආස්තරණය (Wallpaper)
- වීදුරු භාවිතය / ග්ලාස් බ්ලොක් යෙදීම (Glass / Glass block)
- පින්තාරු කිරීම පිටත / ඇතුළත (Painting)

ගෙබිම නිමහම් යෙදීම (Floor finishes)

- කපරාරු කොට සුද මැදීම (Cement rendered flooring)
- ගෙබිම උළු ඇතිරීම (Floor tiles)
- ටෙරාකොටා ඇතිරීම (Terra cotta tiles)
- ටෙරාසෝ කිරීම (Terrazzo)
- ස්වාභාවික / කෘත්‍රිම ගල් ඇල්ලීම (Granite)
- පී.වී.සී. තහඩු ඇළවීම (PVC tiles)
- ඔප දමන ලද දැව කොටස් ඇල්ලීම (Wood panels)

පෙදරේරු ව්‍යූහ නිමහම් යෙදීමෙන් බලාපොරොත්තු අරමුණු

- අලංකාරය
- කල් පැවැත්ම
- තෙතමනයෙන් ආරක්ෂා කිරීම
- පිරිසිදු කිරීමේ පහසුව
- ගොඩනැගිලි අතර කැපී පෙනීම
- සංකේත වර්ණ යොදා ගැනීමෙන් හඳුනා ගැනීමේ පහසුව
- ගින්නට ප්‍රතිරෝධයක් ඇති කිරීම
- ආලෝකය හැසිරවීම
- ඇතුළත උණුසුම / සිසිලස රඳවා ගැනීම
- සෞඛ්‍ය අරක්ෂිත බව
- ගෙවී යෑමට ඔරොත්තු දීම

කපරාරු කිරීම

බැඳුම් ද්‍රව්‍ය සිනිඳු සමාහාර සමග අනුපාතයකට සකස් කර ගත් මිශ්‍රණයකින් මතුපිට තලය ආවරණය කරනු ලැබේ. එමගින් අවශ්‍ය හැඩතල ද මතු කර ගනී. කපරාරු කිරීමේ දී යොදා ගන්නා සියුම් සමාහාර වන්නේ වැලි ය. ඒවා කුඩා සිදුරු සහිත දැලකින් හලා ගනු ලැබේ. වරිච්චි, ගඩොල්, රළු ගල්, කොන්ක්‍රීට් කොටස් සහිත බිත්ති මෙන් ම ගෙබිම ද කපරාරු කිරීමෙන් නිමහම් කරයි. යොදා ගන්නා බැඳුම් ද්‍රව්‍ය අනුව බදාම වර්ගය නම් කරනු ලැබේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

බහුල ව භාවිත කරනු ලබන බදාම මිශ්‍රණ කිහිපයක් සහ මිශ්‍රණ අනුපාත

කපරාරු බදාම වර්ග	මිශ්‍රණ අනුපාත	ද්‍රව්‍ය
01. මැටි බදාම	1: (2-3)	මැටි සහ වැලි
02. හුනු බදාම	1: (3-5) , 2:5	හුනු සහ වැලි
03. සිමෙන්ති බදාම	1: (2-5)	සිමෙන්ති, වැලි
04. සිමෙන්ති, හුනු බදාම	1:1:5	සිමෙන්ති, හුනු, වැලි

මැටි බදාම

4.22 i රූපය - මැටි බදාමයකින් කපරාරු කිරීමක්

ඉහත අනුපාතයට සකස් කර ගත් මැටි ජලය සමග හොඳින් අනා පදම් වීම සඳහා දිනක් පමණ තැබීමෙන් පසු කපරාරු කිරීමට යොදා ගත හැකි ය. නමුත් ජලය හා ගැටීමෙන් කපරාරුව දිය වී යා හැකි ය. හුනු කොළපු යොදා මතු පිට පෘෂ්ඨය මැදීමෙන් මෙම තත්ත්වය අඩු කර ගත හැකි ය.

හුනු බදාම

ඉහත අනුපාතයට සකස් කර ගත් හුනු සහ වැලි ජලය සමග අනා දිනක් වසා තැබීමෙන් පසු කපරාරු ව සඳහා යොදා ගනී. එසේ දිනක් පමණ තැබීමෙන් බදාමයේ ස්විකාර්යතාව වැඩි වේ. මැදීම පහසු ය.

සිමෙන්ති බදාම

4.22 ii රූපය - ගඩොල් බිත්තියක් සිමෙන්ති බදාමයෙන් කපරාරු කිරීමක්

නියමිත අනුපාතයට ජලය සමග මිශ්‍ර කරගත් විගස ම කපරාරු සඳහා භාවිත කළ හැකි ය. හුනු කපරාරුවට වඩා ශක්තියෙන් වැඩි ය. කල්ගත වීමේදී ශක්තිමත් භාවය තවත් වැඩි වේ.

සිමෙන්ති, හුනු බදාම

4.23 රූපය - කපරාරු කිරීම සඳහා බදාම ලෑල්ලට ගත් හුනු සිමෙන්ති බදාමයක්

සිමෙන්ති හුනු සහ වැලි 1:1:5 අනුපාතයට සකස් කර ගත් මිශ්‍රණ කපරාරුව සඳහා වඩාත් යෝග්‍ය වේ. එහෙත් හුනු සහ වැලි ජලය සමග මිශ්‍රකර දිනක් වසා තැබීමෙන් පසු නියමිත අනුපාතයට සිමෙන්ති මිශ්‍ර කර ජලය සමග මිශ්‍ර කර කපරාරු සඳහා යොදා ගැනීමෙන් සාර්ථක නිමාවක් ලබාගත හැකි ය.

බොහෝ විට පිටත බිත්ති සඳහා රළු කපරාරු යොදා ගන්නා අතර ඇතුළත බිත්ති සඳහා සිනිඳු කපරාරු යොදා ගනී. මනිස් ලෑල්ලෙන් මැදීමෙන් රළු කපරාරුව ලබා ගත හැකි ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

රබර් ස්පොන්ජ් කැබලි ද මේ සඳහා භාවිත කරයි. සිනිඳු කපරාරු සඳහා හුනු කොළපු යොදා මැදිය යුතු ය. මේ සඳහා සකස් කළ හුනු පොටි ද වෙළෙඳපොළේ ඇත.

කපරාරු කිරීමේ පියවර

- කපරාරුව සඳහා බැම්ම සකස් කිරීම
- බදුම සකස් කිරීම
- කැට තැබීම
- සිරස් කැට අතර බදුම පිරවීම (මාල සකස් කිරීම)
- මාල අතර පිරවීම
- මාල අතර වැඩි බදුම මට්ටම් පොල්ල භාවිතයෙන් කපා හැරීම
- නො පිර වූ ස්ථාන නැවත පිරවීම
- මනිස් ලෑල්ල භාවිතයෙන් මට්ටම් කිරීම
- කපරාරු හැන්දෙන් මැදීම
- අවශ්‍ය නම් හුනු කොළපු මැදීම

කපරාරුව සඳහා බැම්ම සූදානම් කිරීම

බැම්ම බැඳ එතරම් කාලයක් ගත වී නොමැති නම් කොහු බුරුසුවකින් පිරිසිදු කර ජලය ඉස තෙත් කිරීමෙන් කපරාරුව සඳහා සූදානම් කරනු ලැබේ.ජලය ඉසීමේ දී ඉහළ සිට පහළට තෙත් කිරීම කළ යුතු අතර මතු පිටින් බේරී යන ලෙස තෙත් නොකළ යුතු ය. බැම්ම බැඳ කාලයක් ගත වී ඇත්නම් එහි අපද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් අන්තර්ගත නම් කම්බි බුරුසුව හා සූරන තහඩුව ආධාරයෙන් පිරිසිදු කළ යුතු ය.

බදාම සකස් කිරීම

වැලි හලනයක් මගින් හලා ගත් වැලි, සිමෙන්ති හා හුනු සමග හොඳින් මිශ්‍ර කොට ජලය අවශ්‍ය ප්‍රමාණයට යොදා අනා ගනු ලැබේ. අනාගත් බදාම ප්‍රමාණවත් ලෙස කපරාරු කරන බැම්ම අසල බදාම ලෑල්ලට දමනු ලැබේ.

කැට තැබීම

බැම්මේ ඉහළ කොටසේ කෙළවරකට ආසන්නයේ පළමුවෙන් කැට තබා ගත යුතු ය. අනතුරුව බැම්මේ පහළ කොටස බදාම යොදා ලඹ කොට කැට තබා සිරස් බව රැක ගැනීම කළ යුතු ය.මෙලෙස බැම්මේ දෙ කෙළවරහි කැට තබා සකස් කිරීමෙන් පසු මට්ටම් ලීයේ දිගට නො වැඩි දුරකින් තිරස් හා සිරස් දිගට කැට තබා ගැනීම කළ යුතු ය.මේ සඳහා දික් නූල් ආධාරයෙන් කැට තබා ගැනීම සුදුසු වේ.



4.24 රූපය - ලඹයට අනුව සිරස් කැට තැබීමක්

4.25 රූපය

4.26 රූපය

කැට තබා ඇති අයුරු

සිරස් කැට අතර බදාම පිරවීම (මාල සකස් කිරීම)

සිරස් කැට දෙකක් අතර බදාම ඇතිරීම මාල සකස් කිරීම යනුවෙන් හැඳින්වේ. මාල සඳහා බදාම ඇතිරීමෙන් පසු ඒවා මට්ටම් ලීය ආධාරයෙන් මට්ටම් කිරීම කළ යුතු ය.

4.27 රූපය
මාල දෙකක් අතර බදම පුරවා මට්ටම් ලීය භාවිතයෙන් මට්ටම් කිරීම

4.28 රූපය
සිරස් කැට අතර බදම පුරවා මට්ටම් කිරීම (මාල සකස් කිරීම)

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එසේ සකස් කර ගත් මාල අතර පෙදරේරු හැන්ද ආධාරයෙන් බදාම අතුරා සිරස් මාල දෙකෙහි ගනකම පදනම් කරගෙන මට්ටම් ලීය ආධාරයෙන් වැඩි බදාම කපා හරී. අඩු තැන් ඇත්නම් ඒවා අත් බදාම ලෑල්ලට ගන්නා බදාමවලින් පුරවනු ලැබේ.මනිස් ලෑල්ලෙන් මැද, කොහු බුරුසුව ආධාරයෙන් ජලය ස්වල්පයක් ඉස තෙත් කර නැවත මනිස් ලෑල්ලෙන් මදිනු ලැබේ. එසේ කිරීමෙන් සුමට මතුපිටක් ලබා ගත හැකි ය. තලපාකාරයෙන් සකස් කර ගත් හුනු කොළපු හෝ හුනු පොටි යෙදීමෙන් වඩාත් සුමට මතුපිටක් ලබා ගනී.

4.29 රූපය - පොටි ආලේපනය කිරීමක්

ප්ලාස්ටික් / පී.වී.සී. පැනල් (PVC panels) ඇල්ලීම

ප්ලාස්ටික් / පී.වී.සී. වලින් නිර්මිත පැනල් සවි කිරීමෙන් පෙදරේරු ව්‍යූහ නිමහම් කළ හැකි ය. මේවා ඇතුළත ව්‍යූහ නිමහම් කිරීම සුදුසු වේ. පහත රූපවලින් දැක්වෙන්නේ ප්ලාස්ටික් / පී.වී.සී. පැනල්වලින් නිමහම් කළ ව්‍යූහ කිහිපයකි.

4.30 රූපය
පී.වී.සී. පැනල්වලින් නිමහම් කළ සිවිලිමක්

4.31 රූපය
පී.වී.සී. පැනල්වලින් නිමහම් කළ බිත්තියක්

4.32 රූපය



4.33 රූපය

බිත්ති පැනල්

ඇලුමිනියම් කැලැඩින් (Aluminum cladding)



4.34 රූපය - ඇලුමිනියම් කැලැඩින් කොටසක්

ඇලුමිනියම් කැලැඩින් භාවිතයෙන් ද පෙදරේරු ව්‍යුහ නිමහම් කරනු ලබයි. ඇලුමිනියම් කැලැඩින් යනු නිමහම් සඳහා සකස් කරන ලද ඇලුමිනියම් තුනී තහඩු විශේෂයකි. පිටත නිමහම් සඳහා සුදුසු වේ. ආස්තරණ ඇලවීමෙන් විවිධ වර්ණ ලබා ගත හැකි ය. නඩත්තු වියදමක් නොමැති සේදීම හෝ පිස දැමීම මගින් පිරිසිදු කළ හැකි ය.

4.35 රූපය - ඇලුමිනියම් කැලැඩින් භාවිතයෙන් නිමහම් කරනු ලැබූ ගොඩනැගිල්ලක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කපරාරු කිරීමේ දී භාවිතයට ගන්නා ආවුද හා උපකරණ

- කම්බි බුරුසුව
- රයිසිය / සල් අඩය
- උල් හැන්ද
- කොහු බුරුසුව
- අත් බදම ලෑල්ල
- කපරාරු හැන්ද
- මට්ටම් ලීය

4.36 රූපය - කම්බි බුරුසුව

4.37 රූපය - උල් හැන්ද

4.38 රූපය

4.39 රූපය - කොහු බුරුසුව

4.40 රූපය - අත් බදම ලෑල්ල

බිත්ති / ගෙබිම උළු ඇතිරීම

බිත්ති නිමහම් කිරීමේ දී පිගන් මැටිවලින් නිෂ්පාදිත උළු බිත්තියට සවි කරනු ලැබේ. මේ සඳහා සිමෙන්ති බදමයෙන් කපරාරු කිරීමෙන් පසු දිනක් පමණ වේලීමට තැබිය යුතු ය. පසු ව තෝරා ගත් බිත්ති උළු ජලයෙන් හොඳින් තෙමා සිමෙන්ති කොළපු උළු කැටයේ පිටු පස තවරා දති හැන්දෙන් මට්ටම් කර බිත්තියේ අලවා රබර් මිටියෙන් හොඳට හේත්තු වන තෙක් තට්ටු කළ යුතු ය. ගෙබිම උළු ඇතිරීම ද මෙයට සමාන වේ. ගෙබිම උළු ඇතිරීමේ දී සිමෙන්ති කොළපු යෙදීමට පෙර බිම අතුරා තබා බැලිය යුතු ය.


4.41 රූපය

4.42 රූපය

ගෙබිම උළු ඇතිරීමක්

4.43 රූපය

පී.වී.සී. උළු ගෙබිම ඇළවීම

ටෙරා කොටා ඇතිරීම

මැටි භාවිතයෙන් නිපදවන බිම් උළු විශේෂයකි. ඇතුළත බිත්ති සහ ගෙබිම ආවරණය සඳහා විශේෂයෙන් යොද ගැනේ. ලාභදයී නිෂ්පාදනයකි. පිඟන් උළු සවි කරන ආකාරයට ම මේවා ද සවි කරනු ලැබේ. මැටි නිෂ්පාදනයක් නිසා ගෙවී යෑමට ලක් වේ. සිසිලස රඳවා ගැනීමට සමත් වේ. රූපයේ පෙන්වා ඇත්තේ ටෙරා කොටා ඇතුරුමකි.

4.44 රූපය
ටෙරා කොටා ඇති ගෙබිමක් සවිකර

4.45 රූපය

4.46 රූපය

විවිධ හැඩැති ටෙරා කොටා

ටෙරාසෝ කිරීම

ස්වාභාවික ග්‍රැනයිට්වල ලක්ෂණ මතු කර ගන්නා නිමහම් ක්‍රමයක් ලෙස ටෙරාසෝ කිරීම හඳුන්වා දිය හැකි ය. විවිධ වර්ණ ලබා දෙයි. කුඩු කර ගන්නා ලද ග්‍රැනෝලිතික් (මේවා ටෙරාසෝ චිප්ස් ලෙස හඳුන්වයි) සමග වර්ණක මිශ්‍ර කිරීම මගින් සකස් කර ගන්නා කොන්ක්‍රීට් මිශ්‍රණයකි. නිමැදුම් යන්ත්‍ර භාවිතයෙන් ඔප දැමීම කරනු ලැබේ. නිමැදීම සඳහා රළු සිනිඳු සහ ඉතා සිනිඳු ගල් භාවිතයට ගනු ලැබේ. නිමැදුම් කිරීමේ දී ජලය භාවිත කරයි. සාපේක්ෂ ව ටයිල් සමග සැසඳීමේ වියදම් වැඩි ක්‍රමයකි. ඒ නිසා බහුල ව භාවිත නො කරයි.

4.47 රූපය
ටෙරාසෝ කොටසක්

4.48 රූපය
නිමැදුම් යන්ත්‍ර භාවිතයෙන් ටෙරාසෝ ඔප දැමීමක්

4.49 රූපය
සකස් කරන ලද ටෙරාසෝ බිමක්

විචිත්‍රණය

පැත්තක දිග මි.මී. 40 ට අඩු චතුරස්‍රාකාර හෝ ෂඩස්‍ර පුලුස්සන ලද පිඟන් උළු හෝ වීදුරු කැබලි හෝ විවිධ රටා ඇති වන පරිදි කව්හයිඩ් (Cowhide) කඩදාසි මත ඇලවීමෙන් සකස් කෙරේ. එම අලවන ලද ඒකකයක පැත්තක දිග මි.මි. 305 කි. මේවා බිත්ති, පොළොව සහ විවිධ අත්කම් නිර්මාණ මත සිමෙන්ති කොළපු යොදා අතුරණු ලැබේ. මේ මගින් බිත්ති මත විවිධ රූ රටා මවනු ලැබේ. මෙම කලාව බයිසීනියානු කලාව ලෙස ද හඳුන්වයි. උසස් තත්වයේ ගොඩනැගිලිවල පිටත බිත්ති අලංකරණය සඳහා ද යොදා ගැනේ.

මෙම රූපයෙන් දක්වෙන්නේ විචිත්‍රණ වීදුරු කොටසකි.

4.50 රූපය

ස්වාභාවික / කෘත්‍රිම ගල් ඇල්ලීම

කපරාරු කරන ලද බිත්ති සහ පොළොව මත සකස් කරන ලද ග්‍රැනයිට් පතුරු අලවනු ලැබේ. මේ සඳහා සිමෙන්ති කොළපු භාවිත කරයි. මේවා රළු මතු පිට සහිත මෙන් ම ඔප දමන ලද මතු පිට සහිත ව ලබා ගත හැකි ය. ස්වාභාවික ගල්වලින් මෙන් ම කෘත්‍රිම ව ද සකසනු ලැබේ.

4.51 රූපය - රළු මතුපිට සහිත ව සකසන ලද ග්‍රැනයිට් කොටසක්



4.52 රූපය - ඔප දමන ලද ග්‍රැනයිට් පතුරු

බිත්ති කඩදාසි ආස්තරණය

මදින ලද බිත්ති මත තීන්ත ආලේප නො කර විවිධ වර්ණ සහ මෝස්තර සහිත කඩදාසි අලවනු ලැබේ. ජලයට ඔරොත්තු දෙන ලෙස සකස් කර ඇති මෙම කඩදාසි පෙර ඇලවුම් සහිත ව ද ලබා ගත හැකි ය. පහතින් දැක්වෙන්නේ පෙර ඇලවුම් සහිත බිත්ති කඩදාසි අලවන ආකාරය යි.

4.53 රූපය - බිත්ති කඩදාසි ඇලවීමක්

4.54 රූපය
බිත්ති කඩදාසි රෝලක්

වීදුරු භාවිතය / ග්ලාස් බ්ලොක් යෙදීම

වීදුරු සහ ග්ලාස් බ්ලොක් යොදා ගැනීමෙන් නිමහම් කිරීම කළ හැකි ය. මි.මි. 2 - 12 දක්වා පැතලි වීදුරු තහඩු ජනේල සහ දොරවල් සඳහා මෙන් ම ප්‍රදර්ශන කවුළු සඳහා ද බහුල ව යොදා ගැනේ. ආලෝකය විනිවිද යෑම ප්‍රයෝජනවත් ලෙස යොදා ගත හැකි ය. සුළං, වැසි, ශබ්දවලින් ඇතුළත ආරක්ෂා වේ. භංගුරතා ගුණයෙන් යුක්තයි. දෙපස වීදුරු අවතල හැඩයක් ගන්නා ඇතුළත කුහර සහිත වීදුරු ගණකයන් ග්ලාස් බ්ලොක් ලෙස හැඳින්වේ. පිටත බිත්ති සඳහා යොදා ගැනේ. ග්ලාස් බ්ලොක් යොදා විවිධ රටා ඇති කළ හැකි ය. උණුසුම රඳවා ගත හැකි ය. ශබ්ද පරිවාරකයකි.

4.55 රූපය - ග්ලාස් බ්ලොක් යොදා නිමහම් කිරීමක්

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

4.56 රූපය - පැතලි වීදුරු යොදා ඇති ගොඩනැගිල්ලක්

පින්තාරු කිරීම හෙවත් තීන්ත ආලේපය

ගොඩනැගිලි නිමහම් කිරීමේ දී තීන්ත ආලේප කිරීම අවසන් නිමහම් ලේපයක් ලෙස බහුල ව භාවිත කෙරේ. ගොඩනැගිලිවල බිත්ති, වහල සෙවිලි, සිවිලිම සහ ගෙබිම පෘෂ්ඨ මත තීන්ත ආලේප යොදනු ලැබේ. මෙම ආලේප යොදනු ලබන පෘෂ්ඨය අනුව ඒවාට ගැළපෙන විවිධ තීන්ත වර්ග නිෂ්පාදකයන් විසින් නිපදවා ඇත. තීන්ත ආලේප කිරීමෙන් මතු පිට පෘෂ්ඨ ආරක්ෂාව, අලංකාරය, කල් පැවැත්ම, ආලෝකය පරාවර්තනය, තාප ප්‍රති විරෝධී බව, ජල විකර්ශක බව, මල නිවාරණය, සුමට බව, වර්ණවත් බව ලබා ගත හැකි ය. මේ සඳහා එමල්ෂන් තීන්ත සහ එනමල් තීන්ත බහුල ව භාවිත කෙරේ. හොඳ නිමාවක් සඳහා යටි ආලේපන ද භාවිත කෙරේ. වෝල් පිලර් යටි ආලේප ලෙස භාවිත කරයි. මේවා සීලර් ලෙස වෙළෙඳපොළෙන් ලබා ගත හැකි ය. තෙතමනයට ඔරොත්තු දෙන සීලර් වෝටර් පෘෆින් සීලර් (Water proofing sealer) ලෙස හැඳින් වේ.

4.57 රූපය



4.58 රූපය
ඇතුළත බිත්ති සඳහා තීන්ත ආලේප කිරීමක්

බිත්තිවල පවතින කුඩා සිදුරු වසා සම මට්ටමට ගෙන ඒම සඳහා පොටි භාවිත කරනු ලැබේ. මේවා තලප ආකාරයෙන් සකස් කොට ඇත. හතරැස් හැන්ද ආධාරයෙන් බිත්තියේ ආලේප කළ හැකි ය. වියළුන පසු වැලි කඩදාසි භාවිතයෙන් සම මට්ටමට ගෙන එනු ලැබේ. ඒ මත පිලර් ආලේප කර ඉතා සිනිඳු වැලි කඩදාසියෙන් මැද තීන්ත ආලේප කරනු ලැබේ. තීන්ත ආලේප කිරීමේ දී බුරුසු හා රෝලර භාවිත කරයි.

4.59 රූපය - වෙළෙඳපොළේ මිල දී ගැනීමට ඇති පොටි භාජනයකි

ගෙබිම තීන්ත ආලේප කිරීම

ගෙබිම සඳහා විශේෂයෙන් සකස් කළ තීන්ත ලබා ගත හැකි ය. සමහර තීන්ත නිෂ්පාදකයින් බේස් සහ හාර්ඩ්නර් ලෙස කොටස් දෙකකට ඇසුරුම් සකස් කර ඇත. ඒවා බර අනුව අනුපාතයකට මිශ්‍ර කර භාවිතයට ගනී. තුනී කර ගැනීමට තුනී කාරක භාවිත කළ යුතු ය.

4.60 රූපය - තීන්ත ආලේප කරන ලද ගෙබිමක්

ගිල්ලීම / අවපාතනය

තීන්ත ආලේප කිරීමේ ක්‍රමයක් ලෙස ගිල්ලීම / අවපාතනය හැඳින්විය හැකි ය. කුඩා ප්‍රමාණයේ නිර්මාණ සඳහා තීන්ත ආලේප කිරීමේ දී මෙම ක්‍රමය භාවිත කරයි. කම්බිවල බැඳ තීන්ත තුළ ගිල්වා ගැනීම හෝ දැලක් මත තබා සකස් කර ගත් තීන්ත බඳුනේ ගිල්වා වැඩි තීන්ත බේරීමට සලස්වා වියළීමට තැබීම කරනු ලැබේ.

4.61 රූපය



4.62 රූපය
ගිල්ලීම මගින් ආලේපනය කිරීම

නොමිලේ බෙදාහැරීම සඳහා ය.